**බලංගොඩ නගර සභාව - 2021**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

බලංගොඩ නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියමිත දිනට පෙර වරිපනම් බදු නොගෙවීම මත 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු දඩ මුදල් ගිණුම්ගත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් ණයගැතියෝ හා සමුච්චිත අරමුදල රු. 1,262,127 ක් අඩුවෙන් දැක්වුණි. | මෙම වරද 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ජ'නල් සටහන් අංක 01 මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වගකීම් යටතේ ණය ප්‍රාග්ධනය ලෙස සභාව විසින් ලබාගත් දිගුකාලීන ණය ශේෂ රු. 93,121,442 ක් දක්වා තිබුණ ද, එහි ඇතුළත් 2022 වර්ෂයේ දී ගෙවීමට ඇති ණය ප්‍රාග්ධන කොටස රු. 6,499,491 ක් ජංගම වගකීමක් ලෙස වෙන්කර දක්වා නොතිබුණි. | ණය ප්‍රාග්ධනයේ දිගු කාලීන හා ජංගම කොටස 2022 වර්ෂයේ සිට නිවැරදිව වෙන වෙනම පෙන්වීමට කටයුතු කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව 2022 වර්ෂයේ දී ගෙවන ලද රු. 51,934 ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත නොකිරීමෙන් මෙහෙයුම් වියදම් හා ණයහිමි ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | මෙම දෝෂය ජ'නල් සටහන් අංක 03 මඟින් 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඈ) | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ප්‍රකාරව 2021 වර්ෂයේදී වෙන්දේසි කළ උපකරණවල පිරිවැය රු. 271,763 ක් වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය රු. 146,913 කින් හා ජංගම නොවන වත්කම් ශේෂය රු. 124,850 කින් වැඩියෙන් දැක්වුණි. | මෙම දෝෂය ජ'නල් සටහන් අංක 04 මඟින් 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අපහරණය කළ වත්කම්වල පිරිවැය වත්කම් ගිණුම්වලින් ඉවත් කළ යුතුය. |
| (ඉ) | ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු පොලී රු. 129,774 ක් ගිණුම්ගත කර නොතිබීමෙන් වර්ෂයේ මෙහෙයුම් ආදායම හා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | ස්ථාවර තැන්පතු සඳහා පොලිය හඳුනා ගැනීම ඒවා කල්පිරීමේදී සිදුකරන බව. | වර්ෂයට අදාළ පොලී ආදායම ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තොග ලෙජරය හා තොග ගබඩා පාලන ගිණුම අතර රු. 1,605,502 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ඊට අදාළ උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,063,975 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 23,422,086 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ වරිපනම් හා බදු රු. 2,418,880 ක් හා ඉකුත් වර්ෂවලට අදාළ හිඟ වරිපනම් හා බදු රු. 3,443,614 ක් 2022 මාර්තු 31 දින වනවිටත් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. | හිඟ වරිපනම් මෙන්ම ප්‍රවර්ථන වර්ෂයේ වරිපනම් අයකර ගැනීම සඳහා ක්‍රියා කරන අතරම හිඟ වැඩිපුර පවතින දේපළ සඳහා ලිපි මඟින් දැනුවත් කර ඇත. තවද විශේෂ ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කර 2022 වර්ෂයේ ආරම්භයේ සිට වරිපනම් අයකිරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | ඉම්පීරියල් සිනමාහල ඉදිරිපිට පිහිටි එකතුව වර්ග මීටර් 38.43 ක් වූ අනවසර කඩකාමර 14 ක් සඳහා මාස 06 ක සිට මාස 29 ක් දක්වා කාල සීමාවක් තුළ අයනොවී පැවතුණු හිඟ කුලී රු. 199,250 ක් 2022 අප්‍රේල් වනවිටත් අයකර ගෙන නොතිබුණි. | ඒවා පවත්වා ගෙනයන අය විසින් සුළු ඉඩ ප්‍රමාණයක තාවකාලිකව ඉදිකර ගන්නා ලද කුඩා කඩකාමර බැවින්, නගර සභාව විසින් එම කඩකාමරවලින් පදික වෙළෙන්දන්ගෙන් | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| එම කඩ කාමර සඳහා දිනකට රු. 50 බැගින් මසකට රු. 1,500 ක කඩ කුලියක් අයකරමින් පැවති අතර එම කුලිය වර්ෂ 05 කට වරක් සංශෝධනය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | අයකරන ගාස්තු පදනම් කරගෙන මාසික කුලියක් අය කරනු ලබයි. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍යතා හඳුනාගැනීමකින් හා නිසි තාක්ෂණික ඇගයීමකින් තොරව 2017 ඔක්තෝබර් 25 දින මිලදී ගන්නා ලද රු. 98,450 ක් වටිනා විදුලි බල්බ 110 ක් හා 2020 පෙබරවාරි 18 දින මිලදී ගන්නා ලද රු. 257,500 ක් වටිනා විදුලි බල්බ 50 ක් 2022 මාර්තු 31 දින වනවිටත් නිෂ්කාර්යව පැවතුණි. | වීථි පහන් සඳහා 2017 දී මිලදී ගෙන ඇති බල්බ සඳහා නඩත්තු වියදම් වැඩිවීමත්, ක්‍රීඩාපිටිය ආලෝකකරණය කිරීම සඳහා මිලදී ගනු ලැබූ ද්‍රව්‍යයන්වලට එක්ව උපයෝගී කරගතයුතු අනෙකුත් උපාංග සඳහා මිල ගණන් කැඳවන ලද නමුත් ඒවා වෙළඳපල තුළ ලබා ගැනීමේ හිඟයක් පැවතීමත් මෙම තත්ත්වයට හේතු වී ඇති බව. | අවශ්‍යතාවයන් පැහැදිලිව හඳුනාගෙන භාණ්ඩ මිලදී ගතයුතු අතර, වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය සම්මත කර ගැනීමට සභාව කටයුතු කර නොතිබීම නිසා සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයා විසින් නගර සභාවේ 2021 වර්ෂයේ කාර්ය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පුනරාවර්තන වියදම් දැරීමේ බලය පමණක් අංක 2211/57 දරන ගැසට් පත්‍රය මඟින් සභාවට ලබා දී තිබුණි. | 2021 වාර්ෂික අයවැය සම්බන්ධයෙන් ගරු සභාපති ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය ගන්නා දේශපාලනමය ප්‍රතිපත්ති හා තීරණ බලපාන බව හා පෙන්වා දුන් කරුණු සත්‍ය බව. | 255 වන අධිකාරිය නගර සභා ආඥා පනත ප්‍රකාරව, සභාවේ කටයුතුවල අඛණ්ඩ පැවැත්ම සඳහා සභාපතිවරයා ඇතුළු සභිකවරුන් කටයුතු කළ යුතුය. |

සභාවේ කටයුතුවල අඛණ්ඩ පැවැත්ම සඳහා කටයුතු කිරීම 255 වන අධිකාරිය නගර සභා ආඥා පනත ප්‍රකාරව සභාපතිවරයා ඇතුළු සභිකවරුන්ගේ අත් නොහැරිය හැකි වගකීමක්ව තිබිය දී අදාළ තැනැත්තන් විසින් වගකීම් සහගතව කටයුතු නොකිරීම නිසා 2021 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් දැරීමට නීතිමය අධිකාරය නොමැති වීමෙන් වාර්ෂික අයවැය මඟින් වෙන්කර තිබූ රු. 53,075,000 ක සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.